සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**8 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **ප්‍රශ්න අංක 01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයක් ලෙස ............................................ සංවිධානය හඳුනාගත හැකිය. (යුනෙස්කෝ / යුනිසෙෆ් / සාර්ක්)

02. අනුරාධපුර යුගයට අයත් ............................................................ රජතුමාගේ රාජ්‍යය කාලයේ ගම් දහයකට එක් වෛද්‍යවරයෙකු බැගින් පත්කළ බව සඳහන් වේ. (බුද්ධදාස / පණ්ඩුකාභය / දේවානම්පියතිස්ස)

03. පොලිස් හදිසි ඇමතුම් සේවා හා මහජන පැමිණිලි ඉදිරිපත් කළ හැකි කෙටි දුරකථන අංකය ............................................................ වේ. (110 / 118 / 119)

04. කඩොලාන පරිසර පද්ධති විනාශ කිරීම නිසා ............................................................................ තත්ත්වයක දී ඇතිවිය හැකි හානි වර්ධනය විය හැක. (නියඟ / සුනාමි / සුළි සුළං)

05. පැහැදිලි අරමුණු හා ඉලක්ක නොතිබීම ................................................................................ නායකත්ව ශෛලිය තුළ දැකිය හැකි ලක්ෂණයකි. (නාමික/ ඒකාධිපති / ප්‍රජාතන්ත්‍රවාදී)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. පොදු සේවා සැපයීමේ අරමුණ ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමයි. ( )

07. වර්තමාන සමාජයේ වැඩි වශයෙන් දැකිය හැක්කේ විස්තෘත පවුල් ඒකකය. ( )

08. මානව සම්පතෙහි අභිවෘද්ධිය සහ යහපැවැත් ම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වන්නේ අධ්‍යාපනය යි. ( )

09. මුස්ලිම් ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස සලකනු ලබන මක්කම වන්දනා සමය සැමරීම සඳහා රාමසාන් උත්සවය සමරනු ලැබේ. ( )

10. චිත්තවේග සුබවාදීව හසුරුවා ගැනීම හරහා ආවේගවලට ලක් නොවන සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු බවට පත් වේ. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ ආරම්භ කළ පොදු සේවාවකි.

    (1) තැපැල් හා විදුලි පණිවුඩ (2) ආරක්ෂක සේවය

    (3) සෞඛ්‍ය සේවය (4) ජල සම්පාදනය

12. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක ලක්ෂණයකි,

    (1) බහුතර මතය ප්‍රතික්ෂේප කිරීම.

    (2) අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු නොකිරීම.

    (3) සම්මුතියෙන් තීරණවලට එළඹීම.

    (4) අන්මත ප්‍රතික්ෂේප කිරීම.

13. නායකයෙකු සතුවිය යුතු ආවේදනීය හැකියාවකි.

    (1) ඉලක්ක තීරණය කිරීම. (2) ස්ථිරසාර බව.

    (3) සංවේදී බව. (4) ගැටලු නිවැරදිව නිරාකරණය

14. අප රෝගී වූ විට ඖෂධ භාවිතයේ දී ඉතාමත් සැලකිලිමත් විය යුතු එහි දී අප විසින් නොකළ යුතු දෙයකි.

    (1) නියමිත වෛද්‍ය උපදෙස් පිළිපැදීම. (2) අන්තරායකාරි ඖෂධ භාවිතය

    (3) ඖෂධවල නියමිත මාත්‍රාව භාවිත කිරීම. (4) ඖෂධ නියමිත උෂ්ණත්වයේ ගබඩා කිරීම.

15. බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ඇතිවන වාසියකි.

    (1) ගැටුම් සුලභ වීම. (2) සාමූහිකත්වය බිඳ වැටීම.

    (3) තිරසර සාමයක් ගොඩනැගීම. (4) රට සංවර්ධනය නොවීම.

- **අංක 16 සිට 20 දක්වා A හා B තීරු දෙකේ සම්බන්ධතාවය තේරුම්ගෙන යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16. | රොබට් නොක්ස් | ★ සුනාමි |
| 17. | පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලිය නිසා ඇතිවන ස්භාවික විපතකි. | ★ සංස්කෘතිය පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත. |
| 18. | ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි. | ★ එදා හෙළදිව |
| 19. | කාලගුණික හා දේශගුණික විපර්යාස නිසා ඇතිවන ස්වභාවික විපතකි. | ★ යුතුකමේ අගය |
| 20. | ඊ. බී. ටයිලර් | ★ එල්නිනෝ |

(ල. 2 × 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16 ක්ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමි වේ.**
- **පිළිතුරු ලිවීම සඳහා වෙනම කඩදාසි භාවිතා කරන්න.**

01. (i) තැපැල් සේවය මගින් ජනතාවට සැපයෙන සේවා 02 ක් නම් කරන්න.

(ii) ශ්‍රී ලංකාව තුළ පරිසර සංරක්ෂණය සඳහා පිහිටුවා ඇති ආයතන 02 ක් නම් කරන්න.

(iii) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා පාසල ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් 02 ක් සඳහන් කරන්න.

(iv) සතුටුදායක චිත්තවේගී අවස්ථාවක දී පුද්ගලයා තුළ ඇති විය හැකි බාහිර ප්‍රතික්‍රියා 02 ක් සඳහන් කරන්න.

(v) ශ්‍රී ලංකාව තුළ සෑම වාර්ගික හා ආගමික කණ්ඩායමක්ම පොදුවේ වැඳුම් පිදුම් කරනු ලබන ස්ථාන 02 ක් නම් කරන්න.


(vi) ඉතා සංකීර්ණ බහු සංස්කෘතික ජන සමාජයන් සහිත රටවල් 02 ක් නම් කරන්න.

(vii) රසායනික ද්‍රව්‍ය භාවිතයට ගනු ලබන අවස්ථා 02 ක් නම් කරන්න.

(viii) තිරසර සංවර්ධනය ඇති කිරීමට පුරවැසියකු ලෙස අපට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 02 ක් සඳහන් කරන්න.

(ල. 2 × 8 = 16)

02. (i) පොදු සේවා මහජනතාව වෙත සපයන ආකාරය අනුව ආකාර 03 ට වර්ග කළ හැකිය. හිස්තැන් පුරවන්න. (ල. 02)




(ii) පොදු සේවාවල පොදු ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(iii) පොදු සේවාවක් ලෙස පානීය ජලය සැපයීම අවශ්‍ය වීමට බලපාන හේතු 02 ක් ලියන්න. (ල. 02)

(iv) අප එදිනෙදා ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා 02 ක් පහත දැක්වේ. එම පොදු සේවා සපයන ආයතනවලින් පුරවැසියන්ට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ලියා දක්වන්න. (ල. 05)

| පොදු සේවය | පුරවැසියන්ට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් |
|---|---|
| විදුලිය | A ................................................................<br>B ................................................................ |
| අධ්‍යාපනය | C ................................................................<br>D ................................................................ |
| සෞඛ්‍ය සේවය | E ................................................................ |

03. (i) පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ඇතුළත් කරමින් පහත චාර්ට් සටහන සම්පූර්ණ කරන්න. (ල. 04)

පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ

A ............................

B ............................

C ............................

D ............................

(ii) පවුල තුළ සියලු සාමාජිකයන් එක්ව සමගියෙන් කටයුතු කරන අවස්ථා 03 ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) වර්තමානයේ දරුවන්ට සමාන අවස්ථා අහිමි වීමටත්, විවිධ පීඩාවන්ට ගොදුරු වීමටත් බලපාන හේතු 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(iv) ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කරදීමේ අරමුණින් පිහිටුවා ඇති ආයතන 02 ක් නම් කරන්න. (ල. 02)

04. (i) බහු සංස්කෘතික සමාජය යනු කුමක්දැයි සරලව හඳුන්වන්න. (ල. 02)

(ii) සංස්කෘතියට අයත් අංග 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) පහත පින්තූරවල සඳහන් ආගමික උත්සව සමරනු ලබන ආගමික කණ්ඩායම් නම් කරන්න. (ල. 03)



A ...........................



B ...........................



C ...........................

(iv) බහු සංස්කෘතික ජන සමාජයක ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමෙන් අත්වන වාසි 03 ක් සඳහන් කරන්න. (ල. 03)

05. (i) ස්වාභාවික විපත් යනු මොනවාදැයි සරලව නිර්වචනය කරන්න. (ල. 02)

(ii) වර්තමානයේ මිනිසාට මුහුණ පෑමට සිදුවන අනතුරු හා විපත් විවිධාකාරය. ඒවායේ ස්වභාවය අනුව ප්‍රධාන කොටස් 02 කි. එවැනි විපත් සඳහා උදාහරණ ඇතුළත් කරමින් පහත චාර්ට් සටහන සම්පූර්ණ කරන්න. (ල. 06)

ස්වභාවික විපත්
- A ....................................................
- B ....................................................
- C ....................................................

මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත්
- D .......................................
- E .......................................
- F .......................................

(iii) අකුණු ඇතිවන අවස්ථාවක ඉන් ඇතිවිය හැකි හානි අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග 03 ක් සඳහන් කරන්න. (ල. 03)

06. (i) නායකයා හා අනුගාමිකයා ඇසුරින් පහත වගුව පුරවන්න. (ල. 03)

| නායකයා | අනුගාමිකයා |
|---|---|
| 1. විදුහල්පති | 1. .......................................... 2. .......................................... |
| 2. විහාරාධිපති | 3. .......................................... 4. .......................................... |
| 3. පියා | 5. .......................................... 6. .......................................... |

(ii) ඒකාධිපති හා දූෂිත නායකත්ව ශෛලිවල ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත. ඒවා නිවැරදි ව වගුගත කරන්න.

A - වැරදි පූර්වාදර්ශ ප්‍රදර්ශනය.

B - ඉතා දැඩි ව ක්‍රියා කිරීම.

C - පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම.

D - තර්ජනය කිරීම, බිය ගැන්වීම.

E - සොරකම්, වංචා හා දූෂණ කටයුතුවල නියැලීම. (ල. 05)

| ඒකාධිපති නායකත්ව ශෛලිය | දූෂිත නායකත්ව ශෛලිය |
|---|---|
| 1 ....................................................... | 1 ....................................................... |
| 2 ....................................................... | 2 ....................................................... |
| 3 ....................................................... | 3 ....................................................... |

(iii) ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු විය යුතු ගුණාංග 03 ක් සඳහන් කරන්න. (ල. 03)

07. (i)



A



B

මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික හේතු 02 ක් ඉහත පින්තූරවල දැක්වේ. ඒවා හඳුනාගෙන නම්කරන්න. (ල. 02)

A - ..........................................................................................

B - ..........................................................................................

(ii) A පින්තූරයේ දක්වා ඇති ආකාරයේ මාරක රිය අනතුරු සිදුවීමට රියදුරන් අතින් සිදුවිය හැකි වැරදි 03 ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) පහත සඳහන් මාර්ග සංඥා වලින් කියැවෙන අදහස ලියා දක්වන්න.



A ..................................................................



B ..................................................................



C ..................................................................

(ල. 03)

(iv) මාර්ග අනතුරු වළක්වා ගැනීමේ දී පොලිසිය හා රජය සතු වගකීම් වෙන් වෙන් ව සඳහන් කරන්න.

පොලිසිය → (1) ..................................................................
→ (2) ..................................................................

රජය → (1) ..................................................................

(ල. 03)

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | යුනිසෙෆ් | 06. | ✓ | 11. | 1 | 16. | එදා හෙළදිව |
| 02. | බුද්ධදාස | 07. | × | 12. | 3 | 17. | සුනාමි |
| 03. | 119 | 08. | ✓ | 13. | 3 | 18. | යුතුකමේ අගය |
| 04. | සුනාමි | 09. | × | 14. | 2 | 19. | එල්තිනෝ |
| 05. | නාමික | 10. | ✓ | 15. | 3 | 20. | සංස්කෘතිය පිළිබඳ අදහස් කර ඇත. |

(2 x 20 = ල. 40)

### II කොටස

01. (i) ලිපි හා පාර්සල් යැවීම. / මුද්දර නිකුත් කිරීම. / ටෙලිමේල් පහසුකම් ...... (ල. 02)
(ii) මධ්‍යම පරිසර අධිකාරිය / වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ....... (පිටුව 25)
(iii) සාහිත්‍ය සමිති, ආගමික සමිති.... / ජාතික උත්වස, ආගමික උත්සවය.... / ශිෂ්‍ය නායක, පන්ති නායක ..... (පිටුව 39)
(iv) සිනාසීම, නැටීම, ඔල්වරසන් දීම, උඩ පැනීම.....
(v) දළදා මාලිගය, ජය ශ්‍රී මහා බෝධිය, කතරගම දේවාලය, නල්ලූර් කෝවිල...... (නිවැරදි පිළිතුර සඳහා ලකුණු ලබා දෙන්න.)
(vi) ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය
(vii) සනීපාරක්ෂක කටයුතු සඳහා / ගෙවතු වගා සඳහා / පාසල් විද්‍යාගාරවල පර්යේෂණ කටයුතු සඳහා ..... (පිටුව 101)
(viii) සම්පත් අධිපරිභෝජනයෙන් වැළකීම. / රටේ පවතින නීති රීතිවලට අනුකූල ව කටයුතු කිරීම. / සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය. (පිටුව 106)

02. (i) A - නොමිලේ සපයන පොදු සේවා
B - මුදල් අයකර සපයන පොදු සේවා
(ii)
- ★ කිසිඳු භේදයක් තොරව සියලු පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැකි වීම.
- ★ අඩු ආදායම්ලාභීන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම.
- ★ ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති වීම....... (පිටුව 06)

(iii)
- ★ දිවයිනේ සෑම ප්‍රදේශයකම අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් තරම් ජල සම්පත සුලභ නොවීම.
- ★ භූගත ජලය හා ගංගා ජලය විවිධ හේතු කාරක නිසා අපවිත්‍ර වී තිබීම...... (පිටුව 07)

(iv) විදුලිය - අඛණ්ඩව විදුලිය සැපයීම. / මහජන පැමිණිලි පිළිබඳ ඉක්මනින් යහපත් ප්‍රතිචාර දැක්වීම.
අධ්‍යාපනය - නිසි පරිදි අධ්‍යාපනය ලබා දීම. / නිපුණතා සංවර්ධනය කිරීම.
සෞඛ්‍ය - රෝගීන්ට නිසි පිරිදි ප්‍රතිකාර කිරීම. / වෛද්‍ය උපදෙස් සැපයීම හා දැනුවත් කිරීම. (පිටුව 26-27)

03. (i)
- ★ ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම.
- ★ සාමකාමී ව ගැටලු නිරාකරණය කර ගැනීම. (පිටුව 35)

(ii)
- ★ විවිධ උත්සව කටයුතු සංවිධානය කිරීම.
- ★ ඉඩමක් / නිවසක් මිල දී ගැනීම.
- ★ වාහනයක් මිල දී ගැනීම...... (පිටුව 36)

(iii)
- ★ මව්පියන් මියයාම, වෙන්වීම, විදේශගත වීම.
- ★ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම.
- ★ දරිද්‍රතාවය
- ★ දරුවන් කෙරෙහි දක්වන අවධානය හා සැලකිල්ල අඩු මට්ටමක පැවතීම.

(iv)
- ★ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.
- ★ පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- ★ ළමා හා කාන්තා කාර්යංශය, ශ්‍රී ලංකා පොලීසිය.

04. (i) එක් රටක තුළ විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන සහ විවිධ ජනවර්ගවලට අයත් පුද්ගලයන් ජීවත් විය හැකිය. එවැනි කණ්ඩායම්වලින් සමන්විත සමාජ බහු සංස්කෘතික සමාජ ලෙස හැඳින්වේ.
(ii) ආගම, ආහාරපාන
භාෂාව, ඇඳුම් පැළඳුම් (නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.)
(iii) A - බෞද්ධ B - හිංදු C - කතෝලික
(iv)
- ★ ජන කොටස් අතර සමගිය තහවුරු වේ.
- ★ රට සංවර්ධනය සඳහා සියලු කොටස්වල දායකත්වය ලැබේ.
- ★ ගැටුම් අවම වේ. (පිටුව 72)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

05. (i) මිනිසාගේ මැදිහත්වීමකින් තොරව ස්වාභධර්මයේ සිදුවන විවිධ වෙනස්කම් නිසා ස්වභාවිකව හටගන්නා ක්‍රියාවලියකින් මිනිසාටත් ඔහුගේ දේපළවලටත් හානියක් සිදුවේ නම් එය ස්වභාවික විපතක් ලෙස විග්‍රහ කළ හැකිය.

(ii) <u>ස්වාභාවික විපත්</u>

සුනාමි, නියඟ, භූමිකම්පා, කුණාටු

<u>මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත්</u>

රිය අනතුරු, අනාරක්ෂිත ඉදිකිරීම්, අක්‍රමවත් ලෙස කැලිකසළ බැහැර කිරීම නිසා ඇතිවන ගැටලු

(iii)
- ★ එළිමහන් ස්ථානවල රැඳී සිටීමෙන් වැළකීම.
- ★ හුදෙකලා ස්ථානවල හෝ උස් ගස් යට හො රැඳී නොසිටින්න.
- ★ දුරකථන භාවිතයෙන් වළකින්න.

06. (i) විදුහල්පති → ගුරුමණ්ඩලය, සිසු දැරු දැරියන්

විහාරාධිපති → සෙසු ස්වාමීන් වහන්සේලා, දායක දායිකාවන්,

පියා → මව, දූ දරුවන්

(ii) ඒකාපධිති - B, D

දූෂිත - A, C, E

(iii) මානව හිතවා දී බව. / අවංකකම. / කැපවීම..... (පිටුව 49)

07. (i) A. රියදුරන් අතින් වන වැරදි.

B. මාර්ගවල පවතින අඩුපාඩු.

(ii)
- ★ බීමත් ව රිය පැදවීම.
- ★ වලංගු රියදුරු බපත්‍රයක් නොගෙන රිය පැදවීම.
- ★ රිය පදවන අතර ජංගම දුරකථන භාවිතය.
- ★ අධික වේගය. (පිටුව 94)

(iii) A - පදිකයන් මාරුවන ස්ථානය ඉදිරියෙන්

B - ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙන්

C - රථවාහන ආලෝක සංඥා ඉදිරියෙන්

(iv) පොලීසිය
- ★ රියදුරන් හා මගීන් දැනුවත් කිරිම.
- ★ යෝග්‍යතාවයෙන් තොර වාහන ධාවනයෙන් ඉවත් කිරීම.

රජය
- ★ මාර්ග නිසි පරිදි නඩත්තු කිරීම.
- ★ රියදුරු පුහුණුව විධිමත් කිරීම. (පිටුව 98)